**දැනුම මූලික සමාජය සඳහා අධ්‍යාපන ව්‍යාපෘතිය - 2015**

-----------------------------------------------------------------

දැනුම මූලික සමාජය සඳහා අධ්‍යාපන ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව සමඟ එළඹී 2007 දෙසැම්බර් 18 දිනැති අංක 2371 එස්ආර්අයි(එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.02 (අ) වගන්තිය හා අංක 0091 - එස්ආර්අයි(එස්එෆ්) දරන ප්‍රදාන ගිවිසුම සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී .

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

------------------------------------------------------------------------------------

ණය ගිවිසුමට හා ප්‍රදාන ගිවිසුමට අනුව දැනුම මූලික සමාජය සඳහා අධ්‍යාපන ව්‍යාපෘතිය, අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රම වෙළඳපළ අවශ්‍යතාවයන්ට අදාළ ද්විතීයික හා තෘතීය අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස උගත් තරුණයන්ගේ රැකියාලාභීත්වය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අපේක්ෂිත බලපෑම වේ. තත්ත්වය, අදාල බව, ඵලදායක බව වැඩි දියුණු කිරීමේ සහ ද්විතීය හා තෘතීය අධ්‍යාපනයට සමානව ප්‍රවේශ වීම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය වේ. ණය හා ප්‍රදාන ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 11,267 කට සමාන එජඩො මිලියන 105 ක් වේ. ඉන් රු.මිලියන 6,955 කට සමාන එජඩො මිලියන 65 ක් ණයක් වශයෙන් සහ රු.මිලියන 1,605 කට සමාන එජඩො මිලියන 15 ක් ප්‍රදානයක් වශයෙන් ආසියානු සංවර්ධන බැංකුව මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි . ව්‍යාපෘතිය එහි කටයුතු 2008 මාර්තු 07 දින ආරම්භ කළ අතර 2013 ජුනි 30 දින අවසන් කිරීමට නියමිත විය. ආසියානු සංවර්ධන බැංකුවේ 2014 අගෝස්තු 07 දිනැති ලිපිය අනුව, ණය සම්පූර්ණ කළ යුතු දිනය 2014 ඔක්තෝබර් 31 දක්වා දීර්ඝ කරන ලදී. තවද, ආසියානු සංවර්ධන බැංකුවේ 2014 පෙබරවාරි 14 දිනැති ලිපිය අනුව ප්‍රදානය සම්පූර්ණ කළ යුතු දිනය 2015 ජුලි 31 දක්වා දීර්ඝ කරන ලදී. කෙසේ වෙතත්, ප්‍රදානය මඟින් ලබාදී තිබුණු මුදල් මඟින් කරන ලද කාර්යයන්ට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලදි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ

අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුමත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්‍ෂා කිරීම්ද එම පරීක්‍ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය දෙන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය හා ප්‍රදාන යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ආරම්භක, අවසාන ශේෂයන් සහ ප්‍රතිපූර්ණය කිරීම් හා විශේෂ (ඩොලර්) ගිණුමට කරන ලද නැවත පියවීම්, ව්‍යාපෘතිය මඟින් පවත්වාගෙන ගිය ගිණුම් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ අයුරින් පෙන්වා තිබුණු බවට හා 2015 දෙසැම්බර් 31 දිනට පෙන්වන ශේෂ ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යන ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සැසඳුනේද යන බව.

(ඉ) ණය සහ ප්‍රදාන යටතේ කරන ලද ආපසු ගැනීම් ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඊ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශ

------------

### 2.1 මතය

-----

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස සහ දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව ,

(ඇ) ආරම්භක, අවසාන ශේෂයන් සහ ප්‍රතිපූර්ණය කිරීම් හා විශේෂ ඩොලර් ගිණුමට කරන ලද නැවත පියවීම්, ව්‍යාපෘතිය මඟින් පවත්වාගෙන ගිය ගිණුම් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ අයුරින් පෙන්වා තිබුණු බවට හා 2015 දෙසැම්බර් 31 දිනට පෙන්වන ශේෂ ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යන ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සැසඳුනේද යන බව.

(ඈ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඊ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය හා සමාලෝචිත වර්ෂය තුලදී අයවැය ගත ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් උපයෝජනය හා 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය හා ප්‍රදාන ගිවිසුම්වල මූල්‍යයනය කිරීමට එකඟ වූ වටිනාකම | | 2015 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | |
|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) |
| ආ.සං.බැ - ණය | 65.00 | 6,955.00 | - | - | 63.80 | 6,264.19 |
| ප්‍රදාන | 15.00 | 1,605.00 | 15.80 | 14.07 | 14.97 | 1,751.34 |
| ශ්‍රී.ලං.ර. | 25.32 | 2,707.00 | 01.69 | 1.69 | 25.32 | 3,589.48 |
| එකතුව | **105.32** | **11,267.00** | **17.49** | **15.76** | **104.09** | **11,605.01** |

**3.2 භෞතික කාර්යසාධනය**

**------------------------**

පහත නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත සඳහන් කර ඇති පරිදි ප්‍රදානය සඳහා ලබාදී තිබුණු කාලය ගාල්ල දිස්ත්‍රික්කයේ උඩුගම මහා විද්‍යාලයේ ක්‍රීඩාංගනයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට හා කෑගල්ල දිස්ත්‍රික්කයේ දිප්පිටිය මහා විද්‍යාලයේ වැඩි දියුණු කිරීම් මත රඳවාගත් මුදල් නිදහස් කිරීමට 2015 ජුලි 31 දින දක්වා දීර්ඝ කර තිබුණි. තවද, ව්‍යාපෘති ඇගයීම් අධ්‍යයන වාර්තාව සම්පූර්ණ කිරීම ද අපේක්‍ෂා කර තිබුණි. ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඉහත සඳහන් කටයුතු සමාලෝචිත වර්ෂය තුල අවසාන කර තිබුණි.

(ආ) ව්‍යාපෘති ඇගයීම් අධ්‍යයන වාර්තාවේ 4.3 පරිච්ඡේදය අනුව ව්‍යාපෘතිය මගින් පාසැල් 2,127 ක් සඳහා තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ පහසුකම් සලසා තිබුණි. කෙසේ වෙතත්, අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව "පාසැල් ජාලය" මගින් දිවයිනේ පාසැල් 1,644 ක් වෙනුවෙන් පමණක් අන්තර්ජාල සම්බන්ධතා ලබාදී තිබුණි. සමීක්‍ෂණ ප්‍රතිඵල අනුව පාසැල්වලින් සියයට 67 ක් පමණ ව්‍යාපෘතියෙන් සපයන ලද පරිගණක හා විද්‍යාගාර පහසුකම්වල නඩත්තුව පවත්වාගෙන යාම පිළිබඳ සැලසුම් සකස් කර නොතිබුණි. තවද, විගණනයේදී එකතු කරන ලද තොරතුරු අනුව "පාසැල් ජාලය" මගින් දිවයිනේ ජාතික පාසැල් 350 න් 76 ක් වෙත සපයා තිබුණු අන්තර්ජාල පහසුකම්, මන්දගාමී බව හා නිතර සිදුවන පද්ධති බිඳවැටීම් හේතුවෙන් භාවිතා කළ නොහැකි වී තිබුණි.